# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022

2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

**සමාජීය විද්‍යා පීඨය**

**සංවර්ධන අධ්‍යයන**

**සංවර්ධන අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේද - DVST 28224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. රටක සංවර්ධන අභිමතාර්ථ සාර්ථක කරගැනීම සඳහා පර්යේෂණ යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. අ) සංවර්ධන අධ්‍යයන පර්යේෂණ හඳුන්වන්න. (ලකුණු 05)

    ආ) සමකාලීන සංවර්ධන ගැටලු විසඳීම සඳහා යොදාගත හැකි පර්යේෂණ වර්ග දෙකක් (02) දක්වා ඒවා පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 15)

03. අ) 'පර්යේෂණ ගැටලුව' යනු කුමක්දැයි අර්ථකථනය කරන්න. (ලකුණු 05)

    ආ) ඕනෑම පර්යේෂණයක දී 'පර්යේෂණ ගැටලුව' නිවැරදිව හඳුනාගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. අ) 'සාහිත්‍ය විමර්ශනය' යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 05)

    ආ) පර්යේෂණයක දී සාහිත්‍ය විමර්ශනයක් සිදුකිරීමේ අරමුණු පරීක්ෂා කරන්න. (ලකුණු 15)

05. අ) 'නියැදිය' හඳුන්වා, නියැදි භාවිතයේ අවශ්‍යතාව පහදන්න. (ලකුණු 05)

    ආ) ගුණාත්මක පර්යේෂණයකට අදාළව නියැදිය තෝරාගැනීම සඳහා උචිත නියැදුම් ක්‍රම දෙකක් (02) උචිත නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

06. අ) 'සම්මුඛ සාකච්ඡා' මගින් ප්‍රාථමික දත්ත ඒකරාශී කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 05)

    ආ) සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිතයෙන් දත්ත රැස්කළ හැකි පර්යේෂණ පිළිබඳ විවරණයක් කරන්න. (ලකුණු 15)

07. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධන උපායමාර්ග වලදී 'ප්‍රජා මූලික පර්යේෂණ' උපයුක්ත කරගැනීමේ වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 20)

08. පහත මාතෘකා අතුරින් දෙකකට (02) සංක්ෂිප්ත සටහන් සපයන්න.

    අ) ආනුභාවික පර්යේෂණ (Empirical Research)

    ආ) ප්‍රමාණාත්මක පර්යේෂණ (Quantitative Research)

    ඇ) ප්‍රශ්නාවලි ක්‍රමය (Questionnaire Method)

    ඈ) මූලික පර්යේෂණ (Basic Research) (ලකුණු 10x2=20)

**********************************